Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

ශ්‍රේණිය : 6 | විෂය : ගණිතය | සතිය : 6


**පාඩම :- නිමානය හා වටැයීම**
**කාලච්ඡේද ගණන :- 08**

- පෙළපොතේ 74, 75 පිටු හොඳින් අධ්‍යයනය කරන්න.
- ඒ අනුව ගනන් කිරීමෙන් තොරව අනුමාන කිරීමෙන් ආසන්න අගයක් දක්වන අවස්ථා 5 ක් ලියන්න.
  උදා:- කෙසෙල් කැනක ඇති ගෙඩි ගණන දැක්වීම.

**ද්‍රව්‍ය සමූහයක ඇති ද්‍රව්‍ය සංඛ්‍යාව ගනන් කිරීමෙන් තොරව ආසන්න වශයෙන් දැක්වීම නිමානය නම් වේ.**

- පෙළපොතේ 75, 76 පිටුවල නිදසුන 1 හා නිදසුන 2 අධ්‍යයනය කරන්න.

1. A භාජනයේ ඇති ජල පරිමාව 200ml කි. භාජනයේ අල්ලන මුළු ජල පරිමාව නිමානය කරන්න.




A

2. කෙසෙල් කැනක ඇති ඇවරි ගණන 7 කි. ඇවරියක ඇති කෙසෙල් ගෙඩි ගණන 15කි. කෙසෙල් කැනේ ඇති මුළු ගෙඩි ගණන නිමානය කරන්න.

- පෙළපොතේ 76, 77 හා 78 පිටුවල දැක්වෙන 6.1 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
- සංඛ්‍යාවක් ආසන්න 10 ට ලිවීම පිළිබඳව අනුගමනය කල යුතු ක්‍රියා පිළිවෙල ලියන්න.

**පූර්ණ සංඛ්‍යාවක් එයට වඩාත් ආසන්නම දහයේ ගුණාකාරයෙන් දැක්වීම ආසන්න දහයේ ගුණාකාරයට වටැයීම නම් වේ.**

1) පහත සංඛ්‍යා රේඛාව නිවැරදිව අධ්‍යයනය කරන්න. එමඟින් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සපයන්න.




A, B, C, D, E, F, G, H, I මඟින් නිරූපිත සංඛ්‍යා ලියන්න.

එක් එක් සංඛ්‍යාව එයට ආසන්නව ඇති දහයේ ගුණාකාරයට අයත් කොටුව තුල ලියන්න.

| 10 | 20 | 30 | 40 |
|---|---|---|---|
| | | | |

**දහයේ ගුණාකාර දෙකක හරි මැද පිහිටි සංඛ්‍යාවක් එම සංඛ්‍යාව විශාල ආසන්නම දහයේ ගුණාකාරයට ලියනු ලැබේ.**

උදා :-

45 → 50

65 → 70

115 → 120

975 → 980

**සංඛ්‍යාවක එකස්ථානයේ ඉලක්කම 1, 2, 3, 4 නම් එම සංඛ්‍යාවට අඩු ආසන්නතම දහයේ ගුණාකාරයට ද එකස්ථානයේ ඉලක්කම 5, 6, 7, 8, 9 නම් එම සංඛ්‍යාවට වඩා විශාල ආසන්නතම දහයේ ගුණාකාරයට ද වටැයීම සිදු කෙරේ.**

උදා :-

43 → 40

54 → 50

56 → 60

98 → 100

113 → 110

පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| සංඛ්‍යාව | ආසන්න 10 ට වටැයූ විට |
|---|---|
| 15 | 20 |
| 34 | |
| 47 | |
| 95 | |
| 113 | |
| 174 | |
| 186 | |

- පෙළපොතේ 80 පිටුවේ නිදසුන 1, 2, 3 නිවැරදි ව අධ්‍යයනය කරන්න.

පහත දැක්වෙන A කොටුවේ ඇති සංඛ්‍යා අතරින් ආසන්න දහයේ ගුණාකාරයට වටැයූ විට පිළිතුර 50 ලැබෙන සංඛ්‍යා තෝරා B කොටුව තුළ ලියන්න.

| සංඛ්‍යා |
|---|
| 43, 45, 47, 44, 48, 49, 51, 57, 53, 41, 52, 54, 58, 52, 54, 58, 59, 42 |

A

| වටැයූ විට පිළිතුර 50 ලැබෙන සංඛ්‍යා |
|---|
| |

B

- පෙළපොතේ 80, 81 පිටුවල දැක්වෙන 6.2 අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න.
- පෙළපොතේ 82 පිටුව බලන්න. එහි දැක්වෙන මිශ්‍ර අභ්‍යාසය නිවැරදිව සම්පූර්ණ කරන්න. ඔබට මතුවන ගැටළු ගුරුතුමා/ ගුරුතුමිය සමඟ සාකච්ඡා කර නිවැරදි කර ගන්න.